**වැල්ලවාය ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 10 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූනි 23 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

**1.2 මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂය අවසානයට රු. 240,225,624 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද පිළිගත් වෘත්තිය සුදුසුකම් ඇති, තක්සේරු වෘත්තියේ සාමාජිකයකු විසින් තක්සේරු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට නොපියවූ කර්මාන්ත අත්තිකාරම් ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.5,851,603 ක් වූ අතර ලේඛනය අනුව රු. 6,410,089 ක් වුයෙන් රු. 558,486 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සභාව සතු RD -9455 පෝටොන් ට්‍රැක්ටරය, UPZA ජේ.සී.බී. යන්ත්‍රය සහ මාර්ග තලනයේ පිරිවැය හඳුනා ගැනිමකින් තොරව රු. 27,116,323 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සභාව සතු ගිණුම් ගත නොකල සුසාන භූමි ඉඩම් කැබලි 65 ක් සහ වෙනත් ඉඩම් කැබලි 20 ක් හඳුනාගෙන පිළිගත් වෘත්තිය සුදුසුකම් ඇති තක්සේරු වෘත්තියේ සාමාජිකයකු විසින් තක්සේරු කර නොතිබුණි.

**1.3.2 ගෙවිය යුතු ගිණුම්**

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1995 සිට 2000 දක්වා සහ 2002 සිට 2008 දක්වා වර්ෂ 14 ක් සඳහා සභාව විසින් ගෙවිය යුතු රු. 269,756 ක විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට එමින් පවතින සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ විවිධ ගොඩනැගිලි හා විවිධ ස්ථාන 08 ක් සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවිය යුතු රු. 1,190,503 ක ජල ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අංක රහිත 2012 දෙසැම්බර් 24 දිනැති ලිපිය ප්‍රකාර එකතු කළ අගය මත බද්ධ අවලංගු කිරීම මත 2012 දෙසැම්බර් 31 දිනට පෙර අයකළ බදු මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි. එසේ වුවත් 2005 වර්ෂයේ සිට 2013 මාර්තු දක්වා අයකර ගත් රු. 1,813,914 ක් වටිනා එකතු කළ අගය මත බදු මුදල් ගෙවිය යුතු තැන්පත් වශයෙන් රඳවා ගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් හිඟ ශේෂය වන රු. 969,318 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 241,549,730 ක වත්කම් විෂයන් 03 ක්, රු. 5,525,716 ක වගකීම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යනිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

**1.3.4 නීති,රීති,රෙගුලාසිවලට අනුකූල නොවීම**

---------------------------------------

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | |
| (i) 19 (1)(i) වගන්තිය | (අ) පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 31 දක්වා ආදේශක හා අනියම් පදනම යටතේ රියදුරු, මුරකරු සහ කම්කරු යන තනතුරු සඳහා සේවකයින් 15 ක් බඳවාගෙන වැටුප්, දිමනා සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් වෙනුවෙන් රු. 11,281,204 ක් ගෙවා තිබුණි. |

(ආ) පළාත්පාලන කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව සභාවේ කසල අපහරන කටයුතු සඳහා දිනකට රු. 900 ක් ගෙවීමේ පදනම මත සේවකයින් 11 දෙනෙක් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු. 1,176,300 ක් ගෙවා තිබුණි.

(ii) 49 වගන්තිය — සැලසුම් කමිටුවේ අනුමැතියකින් තොරව සභා බල ප්‍රදේශයේ දූරකථන සමාගම් 5ක් විසින් කුළුණු 15 ක් ස්ථාපිත කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි**

මු.රෙ. අංක 71 — 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව සභාවේ අනියම් හා ආදේශක පදනම මත සේවය කළ ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු සහ යන්ත්‍ර ක්‍රියාකරු යන තනතුරු සඳහා සේවකයින් 11 දෙනෙක් අනුමත කාර්යය මණ්ඩලයට පිටින් ස්ථිර සේවයට පත් කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 14,175,429 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,213,369 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 11,962,060 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.25,940,706 ක් වූ හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158, 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

**2.2.2** **වරිපනම් බදු**

**-------------**

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කළ වටිනාකම රු. 6,097,332 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රවර්තන වර්ෂයේ බදු ලෙස රැස්කර තිබුණේ රු. 1,522,368 කි. එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 24ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.

(ආ) 2015 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ආදායම රු. 8,566,302 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට හිඟ බදු ලෙස රැස්කර තිබුණේ රු. 3,029,321 කි. එය සියයට 35 ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.

**2.2.3** **බදු කුලි**

**--------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ කාර්මික නිලධාරි සහ ආදායම් පරිපාලක විසින් සකස් කරන ලද සැලැස්මක් අනුව වැල්ලවාය නගරයේ පිහිටි ඔප්පු අංක 940 දරන ඉඩම සහ වැල්ලවාය ලංකා බැංකුව සහ නව වෙළඳ සංකීර්ණය මැද පිහිටි ඉඩම ටෙන්ඩර් කිරිමකින් තොරව සභා තීරණයක් මත බදු දීමට කටයුතු කර තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 11 දින ටෙන්ඩර් කරුවන්ට බදු දීමට නොහැකි නව සාප්පු සංකීර්ණයේ කඩ කාමර 8ක් 2015 දෙසැම්බර් 11 වන විටත් බදු දීමට කටයුතු කර නොතිබූ අතර කඩ කාමර 2ක් වෙනත් අයට අතුරු බදු දී තිබුණි.

(ඇ) 2007 වර්ෂයේ ටෙන්ඩර් කැඳවා බදු දිමට නොහැකි වූ වැල්ලවාය බස් නැවතුම්පලේ උඩු මහලේ කඩ කාමර 3ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් බදු දීමට කටයුතු කර නොතිබූ කඩ කාමර 6ක් අතුරු බදු දීමට කටයුතු කර තිබුණි.

**2.2.4** **වෙනත් ආදායම**

**----------------**

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ පදිංචි කර ඇති හෝ එම අධිකාරිය අනුමත කර ඇති සහ බල ප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන හෝටලයකින් සහ ලැගුම්හල් 04 කින් අදාල වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් සියයට එක නොඉක්මවන ගාස්තුවක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013, 2014 සහ සමාලෝචිත වර්ෂය තුල සභාව සතු ජේ.සී.බී. යන්ත්‍ර 2 ක සහ මෝටර් ග්‍රේඩරය කුලියට දීම වෙනුවෙන් පුද්ගලයන් සහ ආයතන 15 කින් අයවිය යුතු රු. 1,161,102 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

## 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.5,585,712 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.2,501,931 ක් අයවිය යුතුව තිබුණි.

## 2.3 අධිභාර

--------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 (3)වගන්තියේ විධි විධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2015 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු අධිභාර අගය රු.70,338 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබ.

(අ) තනතුරු 05කට අදාලව අනුමත සේවක සංඛ්‍යාවට වඩා සේවකයින් 17 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ආ) අයවැය ලේඛනයේ ප්‍රතිපාදන සලස්වා නොගෙන සභාවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු නොමැතිව තිබියදි පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා නොගෙන විවිධ කාර්යයන් සඳහා පුහුණුවන්නන් 11 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදි රු. 832,000 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 09 දින පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ලබා දුන් ලීටර් 20 කසල බඳුන් 300 න් 40 ක් අස්ථානගත වී තිබු අතර බඳුන් 260 බෙදා දීමට 2016 අප්‍රේල් 11 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2(1) වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු. 124,200 ක වියදමක් දරා තිබුණි.

(ඉ) 2014 නොවැම්බර් 28 දින බුත්තල ප්‍රාදේශීය සභාව මගින් ලබාදි තිබු ජී.අයි. බට 304 ක් සඳහා නිකුත් කිරීමේ නියෝග ලබාගෙන ලැබීම් නියෝග මගින් ඉන්වේන්ට්‍රි ගතකර කටයුතු කර

නොතිබූ අතර 2016 අප්‍රේල් 08 දින වන විට ජී.අයි. බට 137 ක් ලේඛන ගතකර තිබූ අතර ඉතිරි බට 167 ක් 2016 අප්‍රේල් 11 දින කරන ලද භෞතික පරීක්ෂණයට ඉදිරිපත් නොකෙරුණි. ජී.අයි බට 137 න් බට 75 ක් කැබැලි කර කම්කරු නිවාස සංකීර්ණය සඳහා යොදවා ගෙන තිබුණි

**3.2 අවිධිමත් ගනුදෙනු**

----------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන ද්‍රව්‍ය, අධ්‍යාපන සහ වෛද්‍යාධාර වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 600,998 ක් සභා අරමුදලෙන් ගෙවීම් කර තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ විධිවිධන අනුව අමාත්‍යාවරයාගේ අනුමැතිය ලබා නොගෙන පුහුණු කටයුතු සඳහා රු. 35,000 ක් සභා අරමුදලෙන් ගෙවීම් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදි සභාව විසින් විවිධ කාර්යයන් සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය නොකරමින් වැල්ලවාය නගරයේ පිහිටි පෞද්ගලික ආයතන 7කින් අවස්ථා ගණනාවකදී රු. 221,998 ක ගොඩනැගිලි ද්‍රව්‍ය හා විවිධ උපකරණ ණය පදනම මත මිලදි ගෙන තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

------------------------

සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුල විවිධ ඉදිකිරීම් 04 ක් වෙනුවෙන් මිනුම් පත්‍ර සකස් නොකර රු. 841,862 ක් කොන්ත්‍රාත්කාර සමිතිවලට ගෙවීම් කර තිබුණි.

**3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

-------------------------------

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මක් සභාව මඟින් සකස් කර තිබූ අතර අදාල ඉඩමට වන රක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසර පත්‍රයක් 2012 ජනවාරි 16 වන දින ලබා දී තිබුණ නමුත් සැලැස්ම ක්‍රියාත්මක කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) වැල්ලවාය නගරයේ බැහැර කරන කුණු කසල අවිධිමත් ආකාරයට ආනපල්ලම රජයේ තේක්ක ඉඩමට මුදාහරිනු ලබන අතර පොලිතීන් වැනි දිරාපත් නොවන ද්‍රව්‍ය ප්‍රදේශය පුරා විසිරී යාම නිසා පරිසරයට හානිකර තත්ත්වයක් ඇති වී තිබුණි. කුණු කසල බැහැර කරන ස්ථානයට පැමිණෙන වන අලින්ගෙන් අවට ගම්වලට හානිකර තත්වයක් පැවතිණි.

## 4 යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.4 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජුනි 9 දිනැති අංක කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/ 2009 (01) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.

### 4.5 නොවිසඳි ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

සභාව වෙත 2013 වර්ෂයේ නිකුත් කරන ලද විගණන විමසුමකටද 2014 වර්ෂයේදී විමසුම් 5 කට හා සමාලෝචිත වර්ෂයේදි නිකුත් කරන ලද විගණන විමසුම් 2 කටද මේ දක්වා පිළිතුරු සපයා නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) සන අපද්‍රව්‍ය කළමනාකරණය